# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

**මුදල් අමාත්‍යාංශය**

**සමෘද්ධි , ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා, ව්‍යාපාර සංවර්ධන හා උඌණ උපයෝජන රාජ්‍ය සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය**

**நிதி அமைச்சு**

**சமுர்த்தி, வதிவிடப் பொருளாதார, நுண்நிதிய, சுயதொழில், வியாபார அபிவிருத்தி மற்றும் கீழுழைப்பு பயன்பாட்டு அரச வளங்கள் அபிவிருத்தி இராஜாங்க அமைச்சு**

Ministry of Finance

**State Ministry of Samurdhi, Household Economy, Micro Finance, Self Employment, Business Development and Underutilized State Resources Development**


| මගේ අංකය / எனது இல / My No | ඔබේ අංකය / உமது இல / Your No | දිනය / திகதி / Date |
|---|---|---|
| DSD/HO/04/ER/09- 2020- ගෘහ ආර්ථික | ........................ | 2020.10.13 |

දිස්ත්‍රික් ලේකම් / දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්,
දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ,
ප්‍රාදේශීය ලේකම්,
දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ,
සමෘද්ධි කළමණාකරු,
සමෘද්ධි සංවර්ධන නිලධාරී,
හම්බන්තොට,මොණරාගල,අම්පාර, පොලොන්නරුව,
ත්‍රිකුණාමලය,මඩකලපුව,පුත්තලම, මන්නාරම,
අනුරාධපුරය,වව්නියාව,යාපනය,මුලතිව්,කිලිනොච්චිය.

**<u>ගෘහ ආර්ථිකය පෝෂණය වැඩිදියුණු කර පවුල් ඒකක සවිබලගැන්වීමේ</u>**
**<u>ජාතික ගෙවතු වගා වැඩසටහන - 2020/21 මහ කන්නය</u>**

ආර්ථික පුනර්ජීවනය හා දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා වන ජනාධිපති කාර්ය සාධන බලකාය මගින් ලබාදුන් උපදෙස් පරිදි සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් මහ කන්නය සඳහා ගෘහ ඒකක වෙත බීජ පැකට් බෙදාහැරීමට අදාල සියළු කටයුතු සූදානම් කර ඇත. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන් වෙත ලබාදෙන වියලි කලාපයට අදාල බෝග වර්ග 6 කින් යුත් එළවළු බීජ ප්‍රමාණයන් වෙන් වෙන්ව නිල්ලඹ සමෘද්ධි පුහුණු මධ්‍යස්ථානය මගින් ඇසුරුම් කර ඔබ දිස්ත්‍රික් කාර්යාලය වෙත ලබාදෙනු ඇත.

02. නිල්ලඹ සමෘද්ධි පුහුණු මධ්‍යස්ථානය මගින් ඔබ වෙත දන්වා එවන පරිදි පියවර 2 කදී බීජ ලබාදීමට නියමිත අතර ග්‍රාම නිලධාරී වසමේ ගෘහ ඒකක 210 කෙරෙහිම සැලකිල්ල යොමු කර ලැබෙන බීජ ප්‍රමාණය ග්‍රාමීය කමිටුවේ සියළු නිලධාරීන්ගේ එකඟතාවය මත ප්‍රමුඛතා පදනමින් ගෘහ ඒකක වෙත ලබාදිම සඳහා නැවත දැනුම්දෙන තෙක් ඇසුරුම් කර සුරක්ෂිතව ගබඩා කර තබා ගත යුතු වේ.


1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaram

D/jeev/Sen/2020 Letter/Sen.

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2871672/2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | Hot Line :0112-889007 | | Hot Line:0112-885582 | Hot Line: 011- 28 |

03. ඔබ දිස්ත්‍රික්කය සඳහා වෙන් කළ බීජ ප්‍රමාණයෙන් 50% ක් පමණ 2020.10.12 සහ 13 යන දිනයන්හි දිස්ත්‍රික් කාර්යාලය වෙත ප්‍රවාහනය කරනු ඇත. දිස්ත්‍රික් කාර්යාලයේ සිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය වෙත බීජ ලබාදීම කඩිනමින් කළ යුතු අතර මේ සඳහා යම් ඉන්ධන අත්තිකාරමක් අවශ්‍ය වන්නේ නම් එය මෙම ලිපිය ලද වහාම ඉල්ලුම් කරන මෙන් කාරුණිකව දන්වමි. ඔබ දිස්ත්‍රික්කයට අවශ්‍ය වන ඉතිරි 50% බීජ ප්‍රමාණය 2020.10.15 දිනය වන විට ලබාදීමට නියමිත අතර එම බීජ ද කඩිනමින් පැකට් කිරීම අවශ්‍ය වේ.

04. බීජ පැකට් කිරීමේ කටයුතු සමෘද්ධි ප්‍රජා මූල සමෘද්ධි බැංකු සමිතියේදී (මහා සංගමය) සිදු කළ යුතු අතර මේ සඳහා ග්‍රාමීය කමිටුවේ සියළු නිලධාරීන්ගේ සහාය ලබාගැනීම සුදුසු වේ. බීජ පැකට් කිරීම සඳහා අවශ්‍ය වන පොලිතීන්, බීජ සමඟ ඔබ වෙත ලබාදීමට කටයුතු කරන අතර කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් මුද්‍රිත බීජ බහාලන කවරයක් සහ උපදෙස් පත්‍රිකාවක් ලබාදීමට නියමිත අතර එය ලද වහාම ඔබ වෙත එවීමට කටයුතු කරමි.

මෙම වැඩසටහන සාර්ථක කර ගැනීමට ඔබ ඇතුළු කාර්ය මණ්ඩලයෙන් ලැබෙන සහාය ඉතා අගය කොට සලකමි.

ඒ.ජී. වෙල්ලප්පිලි
අධ්‍යක්ෂ (ආර්ථික සවිබලගැන්වීම් හා ග්‍රාම සංවර්ධන)

අත්.කළේ:- ආර්.පී.බී තිලකසිරි
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්:-
1. ලේකම් - ආර්ථික පුනර්ජීවනය හා දරිද්‍රතාව පිටුදැකීම සඳහා වන ජනාධිපති කාර්යය සාධන බලකාය - කා.දැ.ගැ.පි.
2. ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය - කා.දැ.ගැ.පි.
3. රාජ්‍ය ලේකම්, සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා, ව්‍යාපාර සංවර්ධන හා ඌණ උපයෝජන රාජ්‍ය සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය - කා.දැ.ගැ.පි.
4. අධ්‍යක්ෂ ජනරාල්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.පි.